මනලාරු, සපුමල්තැන්න ආරණ්‍ය විහාරාධිපති පූජ්‍ය ගල්ගමුව චන්ද්‍රබෝධි හිමි ඇතුළු පිරිසක් විහාරයක් ඉදිකර බුදු පිළිමයක් තැබීමට උත්සාහ කල අවස්ථාවේ එම පිරිස සහ ප්‍රදේශවාසීන් අතර ආරවුලක් ඇති වීම හේතුවෙන් සාමයට බාධා එල්ලවී ඇති බව නිරීක්ෂණය වේ.

පසුව මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර, අධිකරණයෙන් අදාල ප්‍රදේශයේ සාමයට බාධා ඇතිවන ආකාරයේ විහාරයක් ඉදිකරීම හෝ බුදු පිළිමයක් තැබීම වළක්වා එම භික්ෂූන් වහන්සේ ඇතුළු පිරිස අදාල ප්‍රදේශයට ඇතුළුවීම තහනම් කල අතර පුරාවිද්‍යා නීතියට අනුව කටයුතු කරන ලෙස පුරාවිද්‍යා කොමසාරිස්වරයාට අධිකරණයෙන් නියෝග නිකුත් කරන ලදී. ඒ සමගම ඈත අතීතයේ සිට එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාව විසින් ඉටු කරන පූජා වැඳුම් පිදුම් අඛණ්ඩව සිදු කිරීම තහනම් කලේ නැත.

තවද, අදාල පුරාවිද්‍යා ප්‍රදේශයේ ආරක්ෂාව සහ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාව සමඟ සාකච්ඡා කර විද්වතුන්, යාපනය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පර්යේෂණවල නිරතව සිටින සිසුන්, ආචාර්යවරුන් සමඟ අධ්‍යනය කර සුදුසු කටයුතු කරන ලෙස අධිකරණයෙන් නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරීවරයා වාර්තාවක් ඉදිරිපත් කරමින් පුරාණ සංකේත ආරක්ෂා කිරීම සම්බන්ධව තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරන බව පවසා ඇති අතර, ඉහත සඳහන් කල අදාල ප්‍රදේශයේ විහාරයක් ඉදි නොකල බවත්, බුදු පිළිමයක් තබා නැති බවත් දන්වා සිටීම නිසා පෙර ලබා දී ඇති තහනම් නියෝගය ඉවත් කර ගන්නා ලදී.

එසේ වූවත් පසුව මුලතිවු පොලීසිය විසින් 2022.06.16 දින ගොනු කල (ඉදිරිපත් කල) වාර්තාවට අනුව අදාල ප්‍රදේශයේ බෞද්ධ විහාරස්ථානයේ චෛත්‍යයක් ඉදිකිරීමට අදාල උත්සවයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් පැවැත්වූ බව දැන ගැනීමට ලැබී ඇත. එම අවස්ථාවේ ප්‍රදේශවාසීන් විසින් එයට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම නිසා නැවතත් සාමයට බාධා එල්ලවී ඇත.

කුරුන්දූර්මලෙයි ප්‍රදේශයේ විහාරයක් ඉදිකර බුදු පිළිමයක් තැබීමට කටයුතු කරමින් සිටින බව එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාව වෙනුවෙන් සහ කුරුන්දූර්මලෙයි පුරාණ අයියනායක කොවිලේ දායකයින් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති චෝදනා සත්‍ය බව ඉහත මුලතිවු පොලීසියේ 2022.06.16 දිනැති අතිරේක වාර්තාවෙන් සහතික වේ.

වවුනියා පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්යාලය විසින් අදාල ප්‍රදේශයේ පුරාණ (පෞරාණික) සංකේත ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර ඇත. නමුත් අදාල වාර්තාව අධිකරණයේ උපදෙස්වලට අනුකූලව සකස් කල වාර්තාවක් නොවේ. මක්නිසාද යත් අදාල ස්ථානය පිළිබඳව විද්වතුන්, යාපනය විශ්ව විද්‍යාලයේ පර්යේෂණවල නිරතව සිටින සිසුන්, ආචාර්යවරුන් මගින් අධ්‍යනය කර සකස් කල ක්‍රියාකාරී සැලැස්මක් බව නිරීක්ෂණය නොවේ.

පුරාණ (පෞරාණික) සංකේත කැනීම් කටයුතු සිදුකරන අවස්ථාවේ දී සහ ඒවා ආරක්ෂා කර නඩත්තු කිරීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් විනිවිදභාවයෙන් කටයුතු කල යුතුය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාණ (පෞරාණික) සංකේත ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක කුටි ඉදිකරන බව අධිකරණයට දන්වා තිබුණි. නමුත් අධිකරණයට කරන ලද ඉදිරිපත් කිරීම්, පොලිස් වාර්තා, ඡායාරූප පිළිබඳ අධ්‍යනය කිරීමේ දී අදාල ප්‍රදේශයේ බෞද්ධ විහාරයක් ඉදිකර ඇති බවත්, පිළිමයක් තැබීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත් දැන ගැනීමට ඇත.

කුමන කරුණ නිසා මෙම නඩුවේ සඳහන් කර ඇති **සාමයට බාධා ඇතිවීම** යන කරුණට අදාල කටයුතු දැනටත් සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය වේ. එම නිසා සාමයට බාධා ඇතිවීමේ තත්ත්වය දිගටම පවතී.

එම නිසා කුරුන්දූර්මලෙයි පුරාවිද්‍යා ප්‍රදේශයේ ඉදිකර ඇති විහාරය සහ ඒ හා සම්බන්ධ ඉදිකිරීම් ඉවත් කරනමෙන් මෙම අධිකරණය විසින් පොලීසියට මෙයින් නියෝග කරයි. එසේම එම ස්ථානයේ පිළිමය හෝ පිළිම තබා ඇත්නම් ඒවාද ඉවත් කරනමෙන් මෙම අධිකරණය විසින් වැඩිදුරටත් පොලීසියට මෙයින් නියෝග කරයි.

මේවා ඉවත් කර ඒ පිළිබඳව මෙම අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් මුලතිවු සහකාර පොලීස් අධිකාරිවරයාට සහ මුලතිවු පොලීසියට මෙම අධිකරණය විසින් මෙයින් නියෝග කරයි.

කුරුන්දූර්මලෙයි පුරාවිද්‍යා ප්‍රදේශයේ ඇති පුරාණ (පෞරාණික) සංකේත ක්‍රමවත් ලෙස ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙසත්, අදාල කටයුතු විනිවිදභාවයෙන් යුක්තව ඉටු කරන ලෙසත් මෙම අධිකරණය විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දන්වා සිටී.

තවද, කුරුන්දූර්මලෙයි පුරාවිද්‍යා ප්‍රදේශයේ එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාව සහ පුරාණ අයියනායක කොවිලේ දායකයින් විසින් අතීතයේ සිට ඉටු කරන පූජා වැඳුම් පිදුම්වලට අවහිර නොවන ලෙස සහ එම ප්‍රදේශයේ ඇති පුරාණ පුරාවිද්‍යා සංකේතවල

පුරාවිද්‍යාත්මක වටිනාකම්වලට වෙනස් නොවන ආකාරයෙන් පුරාණ පුරාවිද්‍යා සංකේත ආරක්ෂා කර නඩත්තු කිරීමට විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කරන ලෙස මෙම අධිකරණය විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත මෙයින් නියෝග කරයි.

ඉහත නියෝයේ අවසන් ඡේද 02 හි සඳහන් කරුණු පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට දන්වන මෙන් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට අධිකරණය විසින් මෙයින් නියෝග කරයි.

අත්සන් කර ඇත.
(ටී.සරවනරාජා)
විනිසුරු,
මහේස්ත්‍රාත් අධිකරණය,
මුලතිවු.
14.07.2022

දිනය : 15.07.2022
මෙය මුලතිවු දිස්ත්‍රික් / මහේස්ත්‍රාත් / ප්‍රාථමික අධිකරණයේ අංක: AR/673/18 දරන නඩුවේ 14.07.2022 දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

සකස් කලේ : (ඉංග්‍රීසියෙන් අත්සන් කර ඇත.)

පරීක්ෂා කලේ : (ඉංග්‍රීසියෙන් අත්සන් කර ඇත.)

රෙජිස්ට්‍රාර් : (ඉංග්‍රීසියෙන් අත්සන් කර ඇත.)

දෙමළ භාෂාවෙන් යුත් මුල් ලේඛනයේ සිංහල පරිවර්තනය මවිසින් කල බව සහතික කරමි.

A.S.M. JIFRI - B.A (Peradeniya)
Justice of the peace (Whole Island)
(Reg. No: 11/11/NWP/W/124)
Sworn Translator / Interpreter (Sinhala/Tamil)
Office: Election Commission, Rajagiriya.
Res 222/1, Thalgaspitiya, Ambakote (N.W.P)
Contact No: 0776538628 / 0719453396

2022.07.16